මාතලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 12 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.2,580,264 ක් වැඩියෙන් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,580,264 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.68,058ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජංගම වගකීම් රු.265,934 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉඩම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම්වල ශේෂයන් රු.55,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් නිමකර තිබූ මාර්ග 3 ක නිවැරදි වියදම ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම (භෞතික සැලසුම්) සහ ණයහිමියෝ රු.244,208 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු වටිනාකම රු.3,353,317 ක් අඩුවෙන් හා ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබියයුතු පොලී ආදායම රු.2,154,582 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.69,449,508 ක් වූ ගිණුම් විෂයන් 3 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.13,481,301 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක වටිනාකම රු.39,174,680 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ එකකට වැඩි කාලයක් තිස්සේ අයනොවී පවතින රු.849,126 ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 14 ක වටිනාකම රු.22,536,796 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ එකකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.2,859,111ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

---------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

-----------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 55,527,951 ක් වූ ගිණුම් විෂයයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

--------------------

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

-----------------------------------------------------------------------------

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | - | 2012 වර්ෂයට පසුව අලුතින් ඉදිකර ඇති මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර නොමැති අතර පැවති මාර්ග මාර්ග සහ ඉදිකළ සියළු මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1893 අංක 9 දරන ගෝඝාතකාගාර ආඥා පනත | | |
| | i. 6 වගන්තිය | - | කෝට්ටේගොඩ ප්‍රදේශයේ පෞද්ගලික පාර්ශවයන් විසින් පවත්වාගෙන යනු ලබන ගව ඝාතකාගාරය වෙනුවෙන්, අදාළ ආකෘතිය ප්‍රකාරව ඇප ඔප්පු ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ii. 9 වගන්තිය | - | විධිමත් පරිදි නිකුත් කළ බලපත්‍රයක් නොමැතිව 2017 ජුනි 23 දිනැති අංක 89930 දරන මුදල් ලදුපත මඟින් යථෝක්ත ස්ථානයේ ගව ඝාතකාගාරය පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදී තිබුණි. |
| | iii. 10 වගන්තිය | - | ඊට ඉහත මාසයේදී මරන ලද සියලු ගවයින්ගේ විස්තර ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව<br>--------------------------------- | | |
| | i. 178(7)(2) රීතිය | - | වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ලැබෙන මිල ගණන් සඳහා ටෙන්ඩර් පෙට්ටියක් නඩත්තු කර නොතිබුණි. |
| | ii. 178(7)(4) රීතිය | 182,068 | ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර් ආකෘති පත්‍රවලට අනුක්‍රමයෙන් අංක යෙදීම, ටෙන්ඩරය විවෘත කරන තැනැත්තා විසින් එකී ටෙන්ඩරයේ එක් එක් පිටුවෙහි ස්වකීය කෙටි අත්සන සහ විවෘත කළ දිනය සඳහන් කිරීම සිදුකර නොතිබුණි. |
| | iii. 217 රීතිය | - | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 570 සහ 571 | 2,309,836 | කල් ඉකුත් වූ කර්මාන්ත තැන්පතු ශේෂ 64ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ගැසට් නිවේදන<br>----------------- | | |
| | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන Aහි "අ" කොටසේ 31 වගන්තිය | - | මස් පිණිස සතුන් මරන ස්ථාන සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබියදී පෞද්ගලික පාර්ශවයකට සහ බල ප්‍රදේශයකට අයත් ස්ථානයක ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,767,098 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,033,610 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,849,000 | 8,717,038 | 6,462,041 | 7,721,011 | 9,349,000 | 9,272,597 | 6,763,301 | 5,454,159 |
| (ii) | කුලී | 25,001,000 | 453,805 | 1,855,910 | 26,500 | 26,405,000 | 485,645 | 2,209,445 | 9,905 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,800,000 | - | 5,430,400 | - | 7,296,000 | - | 3,384,764 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,433,000 | 22,100,000 | 4,005,392 | 21,257,306 | 19,421,000 | 34,202,140 | 4,766,243 | 30,611,340 |

2.2.2 වරිපනම් හා බදු

(අ) වරිපනම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.568,120 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර ඒ සම්බන්ධව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අය නොවූ වරිපනම් බදු ශේෂය තුළ රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු රු.25,320 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ආදායම රු.216,324 ක් වූ අතර වර්ෂයේ ආරම්භක හිඟය වූ රු.212,295 කින් වර්ෂය තුළ රු.2,300 ක් හෙවත් සියයට 1 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඇ) ජල ගාස්තු

(i) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ජල ගාස්තු ආදායම රු.4,152,891 ක් වූ අතර මෙයින් රු.2,313,299 ක් හෙවත් සියයට 56 ක් වර්ෂයක් ඉක්මවා හිඟව පැවතුණි.

(ii) ජල යෝජනා ක්‍රම 3 ක පාරිභෝගිකයින්ගෙන් වසර හතරක කාලයක සිට අය නොවී පවතින රු.489,481 ක හිඟ ගාස්තු හා ජල සම්බන්ධතා විසන්ධි කර ඇති ජල යෝජනා ක්‍රම 9 ක ජල පාරිභෝගිකයින්ගෙන් දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින රු.1,684,774 ක හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.375,166 ක් සහ මුද්දර ගාස්තු රු.21,257,306 ක් විය.

2.3 අධිභාර

---------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මව්සින් ඉකුත් වර්ෂවල පැනවූ අධිභාරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,426,708 ක අධිභාර මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

2017 නොවැම්බර් 10 දිනැති අංක 2045 දරන ගැසට් පත්‍රයේ (iv ආ) කොටස මඟින් ප්‍රකාශයට පත්කර තිබූ ගෝඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සභාබල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ගව ඝාතකාගාරයක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

(i) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සංවර්ධන අංශයේ කාර්යයන් යටතේ ව්‍යාපෘති 90 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් ඉන් ව්‍යාපෘති 70 ක් ඉටු නොකර අතහැර දමා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘති 21 ක් පොදු අරමුදල් මඟින් ඉටුකර තිබූ බැවින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මහජන අවශ්‍යතා හා වෙනත් තොරතුරු නිවැරදිව හඳුනාගෙන සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

---------------------------------------

නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2016 යටතේ තොටගමුව වත්ත ප්‍රධාන පාරේ ආරම්භක කොටසේ පැති කාණුව ඉදිකිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතුවී ඒ සඳහා ලද රු.119,472 ක අත්තිකාරම් මුදල 2017 ජනවාරි 11 දින නැවත අදාළ අමාත්‍යාංශයට යවා තිබූ අතර, ඒ සඳහා වෙන්කළ රු.600,000 ක මුදල් යොදවා වෙනත් සංවර්ධන යෝජනාවක් හෝ ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ මෙට්‍රික් ටොන් 3 කින් කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 400 ක් පමණ නිෂ්පාදනය කර කසළවලින් ඉවත් කරන සියයට 40 ක පමණ පොලිතින් දාහකය යොදාගෙන පිලිස්සීම සිදුකරන නමුත්, අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ "ආ" කොටසේ 27, 28 ප්‍රකාරව සභාවේ ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සහ පොලිතීන් දාහකය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැළසුම් 2018 ජූනි 8 දින වන විටත්, සකස්කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක CP-GS 0504 දරන ට්‍රැක්ටරයේ මයිලෝමීටරය 2014 ජනවාරි 13 දිනට පෙර සිට අක්‍රීය වී ඇති අතර නැවත යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

(ආ) සභා කාර්යාලය සහිත ඉඩම මැනුම් කිරීම සඳහා 2017 පෙබරවාරි 20 දින මාතලේ දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී වෙත රු.57,500 ක් ගෙවා තිබුණද අදාළ මැනුම් වාර්තා ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස කටයුතු කළයුතු වුවත්, ක්‍රියාත්මක මට්ටමේ පවතින සභාවේ ජල යෝජනා ක්‍රම 12 ක ජලය බීමට සුදුසු තත්වයක පවතීද යන්න පිළිබඳව පිළිගත් ආයතනයකින් ජල සාම්පල් පරීක්ෂා කර වාර්තා ලබාගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

(අ) සභාවේ කාර්ය මණ්ඩල තනතුරු 15 කට අදාළව පැවති සේවකයින් 43 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරු වී පැමිණි නිලධාරිනියන් දෙදෙනෙකුගේ ආපදා ණය ශේෂය පියවීම වෙනුවෙන් 2016 දෙසැම්බර් සිට මාසික වැටුපෙන් අඩු කරන ලද රු.235,930 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අරමුදලට ලියන ලද නිෂ්කාශනය නොවූ රු.34,564 ක චෙක්පතක් නිරවුල් කිරීමට කටයුතු නොකර 2015 ඔක්තෝබර් 12 දින සිට මිශ්‍ර තැන්පතු යටතේ දක්වා තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

අනුමත සැලසුම් මත ඉදි කෙරෙන ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 310 කින් 214 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 3 ක් සඳහා පමණ

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී සභාවට ලැබී තිබූ වටිනාකම සඳහන් නොවූ දූමායන යන්ත්‍රයක්, ධාවන තත්ත්යේ නොමැති වාහන 5 ක් හා 2016 ජූලි 28 දින සිට ධාවනයෙන් ඉවත්කළ වාහනයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් මස විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් පරිපාලනය සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් සඳහා සභා පරිශ්‍රය තුළ ශාලා පහසුකම්ද නිර්මාණය කර පරිගණක හා උපාංග, පරිගණක පුටු , පරිගණක මේස 40 බැගින් හා ප්‍රොජෙක්ටර් ස්ක්‍රීන් 1 ක් සහ වායු සමීකරණ යන්ත්‍ර කට්ටල 3 ක් ලබාදී වර්ෂ 3 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ සඳහා ලබාදී තිබූ UPS යන්ත්‍ර 6 ක් 2017 අවසානය වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි.

(ඇ) ගලවා ඉවත් කළ වාහන එන්ජින් 02ක්, JCB යන්ත්‍රයේ ඉවත් කරන ලද පැරණි රිම් 2 ක් සහ රු.55,970 කට මිලදීගෙන භාවිතා කළ නොහැකි තත්වයකට පත්ව තිබූ සෝනි වීඩියෝ කැමරාවක් වර්ෂ 2 සිට 10 දක්වා කාලයක් ගබඩාවේ රඳවා තිබුණි.

3.6 ප්‍රසම්පාදනය

--------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබූ අතර 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.4,423,194 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

අළුවිහාරය සේරුගල පිළිමයට යන මාර්ගය සංවර්ධනය කිරීම.

----------------------------------------------------------------------

පළාත් වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුවේ රු.2,000,000 ක ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභාව සකස් කළ ඇස්තමේන්තුවක් මත රු.1,846,585 ක මුදලකට යථෝක්ත ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි.
කර්මාන්තයේ වැඩ 2017 සැප්තැම්බර් 06 වන විට නිමකර, 2018 ජනවාරි 17 දින රු.1,417,891 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය වේ.

(අ) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 8 යටතේ වර්ග මීටර 750 ක් සඳහා කොන්ක්‍රීට් ගල් (Interlock Blocks) සපයා සවිකිරීම සඳහා වර්ග මීටරයකට රු.1,800ක් බැගින් රු.1,350,000 ඇස්තමේන්තු කර තිබූ අතර, එකී වැඩ විෂය යටතේ ඇස්තමේන්තු සැකසීමේ පදනම හෝ කොන්ක්‍රීට් ගල්වල ප්‍රමාණය (Size), තිබිය යුතු සම්පිණ්ඩන ශක්තිය (Strength) ආදි පිරිවිතර කිසිවක් දක්වා නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සහ කොන්ත්‍රාත්කරු අවස්ථා දෙකකදී සහ වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව එක් අවස්ථාවකදී කොන්ක්‍රීට් ගල්වල තත්ත්වය පරීක්ෂාකර තිබූ අතර, එක් එක් පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබූ ගලක ප්‍රමාණය විවිධ වූ බැවින් හා තත්ත්ව පරීක්ෂණ වාර්තා දෙකකට අනුව සම්පිණ්ඩන ශක්තිය අන්තර් සම්බන්ධිත කැටගල් යෙදීමට අදාළ මාර්ගෝපදේශ අනුව පැවතියයුතු 25N/mm² ප්‍රමාණයට වඩා අඩු බැවින් මෙම කර්මාන්තය සඳහා යොදා ඇති ගල් නියමිත ප්‍රමිතියෙන් යුක්ත නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ඒ අනුව එකී වැඩ විෂය සඳහා රජයේ අනුමත ප්‍රමිතියෙන් යුත් ගල් යොදා නොමැති අවස්ථාවක එම ගල් නිසි ප්‍රමිතියෙන් යුක්ත බවට පිළිගත නොහැකි හේතු දක්වමින් සාධාරණීකරණය කර කොන්ත්‍රාත්කරු වෙත රු.1,079,987 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 3 කට අදාළ රු.16,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 24 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 44 සිට සියයට 1160 අතර පරාසයක පැවතුණි.

(ඇ) වැය විෂයන් 21 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර විචලනය සියයට 42 සිට සියයට 99 අතර පරාසයක පැවතුණි.

(ඈ) වැය විෂයන් 2 ක් සඳහා සලසා දී තිබුණු රු.215,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා ඉතිරි කර තිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණද ආයතනයේ දුර්වලතා මඟහරවා ගැනීම සඳහා ඵලදායී අයුරින් එම කමිටු තීරණ උපයෝගී කරගෙන නොමැති අවස්ථා පැවතුණි.

5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) | අනුමත තනතුරුවල පුරප්පාඩු පැවතීම. |
| | | (ii) | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම. |
| (ආ) | වත්කම් පාලනය | (i) | ඌන උපයෝජිතව හා නිෂ්ක්‍රීයව පැවතීම |
| | | (ii) | නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම. |
| | | (iii) | අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන්ට ලබාදීම. |
| | | (iv) | අයිතිය තහවුරුකර ගැනීමට සහ ආරක්ෂාව සඳහා කටයුතු නොකිරීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම |
| | | (ii) | වාහන ඌන උපයෝජනය හා නිෂ්ක්‍රීයව පැවතීම. |
| | | (iii) | අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන්ට ලබාදීම. |
| (ඈ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම. |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |
| (ඉ) | ගබඩා පාලනය | | ගබඩා ද්‍රව්‍ය නිවැරදිව ලේඛනගත නොකිරීම. |